tamilguru.lk



## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2023

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර වැනි 2024.03.21 දින හෝ ඊට පෙර "සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය"යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ"සුරාබදු නියාමක රියදුරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

03. මාසික වැටුප් ක්‍රමය-: රුපියල් 29,540-7x300-27x370-41,630/-ක් වේ. රුː29,540 ක් වූ මාසික වැටුප මත පිහිටවනු ලැබේ. (රා.ප.ච.3/2016 ට අනුව RS 01- 2016 (PC) උක්ත වැටුප් ක්‍රමයේ 30,440/= වැටුප් තලය ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

04. වයස් සීමාව ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

05. තනතුරට බඳවා ගැනීමට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතු ය.

(i) අධ්‍යාපන සුදුසුකම් :-
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී එක් වරක දී විෂයන් 05කට නොඅඩුව සමත්ව, දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල /දෙමළ භාෂාව හා වෙනත් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම්:-

a. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් ලබා තිබීම.
b. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබා තිබීම.
c. මෝටර් බස්රථ, මෝටර් කෝච්, ''A'' පන්තිය පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

(iii) සේවා පළපුරුද්ද:-
අදාළ බණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් අනතුරුව වසර 03ක මෝටර් වාහන රියදුරෙකු වශයෙන් පිළිගත් ආයතනයක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(iv) කායික සුදුසුකම් :-

a. උස අවම වශයෙන් 5' 4" විය යුතුය.

b. ප්‍රාශ්වාසයේ දී පපුව අවම වශයෙන් 32(අඟල්) විය යුතුය.

c. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

d. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(v) වෙනත් සුදුසුකම්:-
අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

06. බඳවා ගන්නා ක්‍රමය :

(i) රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කෙරේ. මෙම ලිඛිත පරීක්ෂණ සිංහල හා දෙමළ භාෂාවලින් පැවැත්වෙන අතර මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා පවත්වනු ඇත. ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ.

(ii) එම ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ කායික යෝග්‍යතා පරීක්ෂණයට හා රිය පැදවීමේ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයකට භාජනය කොට, ඉන් සමත් වූ අය ඔවුන් එම පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුරාබදු නියාමක රියදුරු තනතුරට පත් කිරීම සඳහා තෝරා ගනු ඇත.

tamilguru.lk



(iii) ලිඛිත විභාගය :

| විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | පැය 03 | 100 | 40% |
| 11.පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 වි.30 | 100 | 40% |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | මහා මාර්ග නීති පිළිබඳව දැනුම, කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම සහ එම ක්ෂේත්‍රයන්ට අදාළ දෝෂයන් පිළිබඳව මූලික අවබෝධය මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |
| 11. පොදු ප්‍රශ්න පත්‍රය | අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා සකස්වන පොදු ප්‍රශ්න පත්‍රයකි. |

පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් අනුමතකරනු ලබන ආයතනයක් මගින්

(iv) **වෘත්තීය පරීක්ෂණය** : රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි

| | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණතාවය | 40 | 40% |

පවත්වන බලධරයා : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ- මො`ටර් රථ පරීක්ෂකවරයකු, පොලිස් සෙවයේ නිලධාරියකු හා දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගෙ න් සමන්විත මණ්ඩලයක අධීක්ෂණය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්ගෙ 'මෙහෙයවීම යටතේ මෙම වෘත්තීය පරීක්ෂණය පවත්වනු ඇත.

(v) කායික යෝග්‍යතා පරීක්ෂණය : බඳවා ගැනීමේ පටිපාටියේ 7.2.2.4 වගන්තිය අනුවඅදාල සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා

(vi) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුරාබදු නියාමක රියදුරු තනතුරට සෑම අතින්ම යෝග්‍ය පුද්ලයකු ද යන්න පරීක්ෂා කිරීම අවශ්‍ය මූලික සුදුසුකම් තිබේ ද යන්න පරීක්ෂා - කර බැලීම (සහතික පත් පරීක්ෂාව)

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :සුරාබදු කොමසාරිස් ජනරාල්

07. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය. මෙම තනතුර සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝග යටතේ පාලනයවන නිල ඇඳුම් (යුනිෆෝම්) අඳින තනතුරකි.

08. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 2310/29 හා 2023.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

09. මෙම පත්වීමට අදාළ බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා ඒ පිළිබඳව තීරණය කරනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන ඉල්ලුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් ආදිය ගෙවනු නොලැබේ.

එම්. ජේ. ගුණසිරි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2024 පෙබරවාරි මස 22 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023

01. (අ) සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................................
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................................................................................
(ඇ) මුලකුරු සහිත නම :..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

03. ජංගම දුරකථන අංකය :- | | | | | | | | | | |

04. වර්තමාන ලිපිනය :..........................................................................................
(අ) ස්ථිර පදිංචි ලිපිනය :..........................................................................................

(ආ) පොලිස් ස්ථානය :..........................................................................................

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු ද යනවග ඃ නැතහොත් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :................

06. විවාහක අවිවාහක බව :————.

07. උපන්දිනය :-

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

08. ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :-

අවුරුදු :————. මාස :————. දින :————.

09. අධ්‍යාපන සුදුසුකම් :-

විභාග අංකය :- විභාග වර්ෂය :-

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10. පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ.මී :————. අඟල් :————.

11. උසඃ සෙ.මී :————. අඩි :————. අඟල් :————.

12. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ සඳහා පෙනී සිටීමට ඔබ ඉල්ලුම් කරන මාධ්‍යය ඃ

සිංහල ☐ දෙමළ ☐

13. ඉල්ලුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම්, තනතුරු සහ ලිපිනය ඃ-

(i) ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

(ii) ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

14. ඔබ මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තරඃ-

(i) වර්තමාන තනතුර හා සේවා ස්ථානය :————.

(ii) එම තනතුරෙන් ඉවත් වී ඇත්නම් ඊට හේතු සඳහන් කරන්න. :————.

මා විසින් සපයා ඇති ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කර සහතික කරමි. එසේ ම ඉහත සඳහන් කරන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය ඒවා බව පසුව හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත්, එම පත්වීම කිසිම වන්දියක් නොමැතිව අවසන් කිරීමට යටත්වන බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

02-828

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.